ENVIRONMENT POLICIES FOR A BETTER SRI LANKA 2020.

ප්‍රතිපත්ති ප්‍රකාශය:
පරිසර ආරක්ෂණය

දැක්ම : පරිසර හිතකාමී නීති රීති, සමාජ පුරුදු හා භාවිතාවන්, ඇදහිලි හා විශ්වාස සහ වර්තමාන සහ අනාගත පරම්පරාවල ආකල්පමය වෙනස් කම් උපයෝගී කරගනිමින්, ස්වභාවික සම්පත් තිරසාර ලෙස ප්‍රයෝජනයට ගන්නා ජෛව විවිධත්වයට හානි නොකරන, ගෝලීය කාළගුණ වෙනස්කම් වලට යහපත් ලෙස අනුගත වන පුද්ගලික හා රාජ්‍ය වැඩපිළිවෙලවල් වලින් සමන්විත රටක් ගොඩනැඟීම.

Protect and improve the environment as a valuable asset which is supporting a sustainable society and economy of better Sri Lanka!

1. සංවර්ධිත සහ සංවර්ධනය කළ හැකි ගොඩබිම, අභ්‍යන්තර ජලාශ, වගුරු බිම්, පතන බිම්, නිසරු බිම්, අති සංවේදී පරිසර කළාප, භූගත පරිසරය, වායුගෝලය, වෙරළ සහ සාගරය ඇතුළු සියළුම පරිසර කලාපයන් හා එහි ඇති ජෛව විවිධත්වය මෙහි පහත දැක්වෙන ප්‍රතිපත්ති වලින් ආවරණය වේ. ඒ අනුව, මධ්‍යම රජය සහ පළාත් පාලන ආයතන වලින් කෙරෙන සියළුම් සංවර්ධන කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්‍යාල මට්ටමින් පිහිටුවන පරිසර කමිටු වලින් අනුමත විය යුතු ය.

3. එම පරිසර කමිටු පිළිබඳ උනන්දුවක් දක්වන දිස්ට්‍රික් මට්ටමේ (නිසි අධ්‍යාපන සුදුසුකම් සහිත) රජයේ නිළධාරීන්, අදාල ප්‍රාදෙශීය ලේකම් කාර්‍යාලයයේ සංවර්ධන නිළධාරී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ සිවිල් සංවිධාන නියෝජිතයින්, ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ප්‍රදේශයේ පාසල් වල තෝරාගත් සාමන්‍ය පෙල හෝ උසස් පෙළ සිසුන් දෙදෙනෙක් හා සිසුවියන් දෙනෙක් යන අයගෙන් සමන්විත විය යුතු යැයි යෝජනා කරමු.

4. මිනිසුන්ට අවශ්‍ය නොවෙන, දැනට පවතින හෝ ඉදිරි අවුරුදු 25 තුළ ඇතිවෙතැයි සාධනීයව බලාපොරොත්තු නොවෙන කිසිදු ගැටළුවක් ආමන්ත්‍රණය නොවේ නම්, කිසිදු කුඩා හෝ මහා සංවර්ධය ව්‍යාපෘති ආරම්භ නොරකමු. ජනප්‍රිය රැල්ලේ පාවෙමින්, හුදෙක් ජනතාවගේ ඇස පිනවීම පිණිස විදේශ වලට ණය වෙමින්සංවර්ධන කටයුතු සිදු කරන සම්ප්‍රදාය වහාම නතර කරන්නෙමු. අනවශ්‍ය පරිසර විනාශය අවම කිරීම මෙහි අරමුණයි.

5. වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාව තුළ කටුපොල් වගාව තහනම් කරමු.

6. බෑවුම් සහිත ප්‍රදේශ වල වගා කටයුතු කිරිමේදී (විශේෂයෙන් තේ, කුරුඳු, රබර්, ගම්මිරිස් ආදී වගාවන්) දැනට ප්‍රචලිත ක්‍රමය වන සියළු ගස් හා පැළෑටි ඉවත් කොට ඉඩමෙහි මතුපිට පස් තට්ටුවුව සෘජුව නිරාවරණය වන ක්‍රමවේදය නතර කිරීමට පියවර ගන්නා අතර ඒ සඳහා තේ සංවර්ධන නිළධාරීන්, පොල් සංවර්දන නිළධාරීන් ආදී ව්‍යාප්ති සේවකයින් ගේ දැනුම හා ආකල්ප වෙනස් කිරීමට පියවර ගනු ලැබේ. ඒ හරහා වගාකරුවන් ගේ සිතිවිලි හා වැරදි විශ්වාස ආදිය දුරු කොට, වඩාත් පරිසර හිතකාමී වගා ක්‍රම සහ පුරුදු ඇති කිරීමට පියවර ගනු ලැබේ.

7. වනජීවී හා වන සම්පත් යන දෙපාර්තමේන්තු, වෙරළ සංරක්ෂණ හා තවත් අවිධිමත් ලෙස බෙදී ඇති එවැනි දෙපාර්තමේන්තු සහ මන්ඩල, අධිකාරි, සංස්ථා ආදිය එකම අමාත්‍යාංශයක් යටතේ පාලනය වන ලෙස ප්‍රතිව්‍යුහගත කෙරෙනු ඇත. එමගින් එම ආයතන වල අන්තර් සබඳතාවය වඩා ශක්තිමත් කොට, ප්‍රතිපත්ති හා තීරණ පරස්පර නොවෙන සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිපාලනමය වටපිටාව සකස් කරමු.

8. පොල් ඉඩම් කැබලි කිරීම වඩා විධිමත් ලෙස හා ශක්තිමත් ලෙස තහනම් කෙරෙනු ඇත. දැනට මීට සමගාමී නීති පැවතුණද, ඒවායේ අඩුපාඩු නිසා පුද්ගලික දීපළ වෙළඳාම් සමාගම් විසින් සිදු කරන පොල් ඉඩම් විනාෂය වහාම නතර කරමු. දැනට දිවයිනේ ඉතිරි වී ඇත්තේ ඉතා අඩු පොල් ඉඩම් සන්ඛ්‍යාවක් නිසා මෙම නීතිය ඉක්මනින් ක්‍රියාත්මක කරනු ලැබේ.

9. ඉඩම් ගොඩකිරීමේ පණත අහෝසී හෝ සන්ශෝධනය කරනු ලැබේ. දැනට පහත් බිම් ගොඩ කිරීම නිසා ඇතිවී තිබෙන සුවිශාල පරිසර ගැටළු සහ ආපදා තත්වයන් ට පිළියම් සෙවීම සඳහා නව (කඩිනම්) වැඩපිළිවෙලක් සකස් කරමු.

10. කෘෂිකර්මාන්තය හැකි තරම් දුරට ස්වභාවිකව කිරීමට සහ, කාබනික ක්‍රම යටතේ සිදු කිරීමට අපේක්ෂා කරමු. තේ, පොල්, රබර්, උක් වැනි වාණිජ භෝග මෙන්ම, වාණිජ අරමුණු වෙනුවෙන් වගා කරන එළවළු පළතුරු ආදිය කාබනික ක්‍රමයට වගා කිරීම වහාම ආරම්භ කර, ඉදිරි වසර 10 තුළ ශ්‍රී ලංකාවේ වගා කටයුතු වලින් අවම වශයෙන් 70% ක් වත් කාබනික වගාවට පරිවර්තනය කිරීමට කටයුතු කරමු.

11. භූගත ජල මූලාශ්‍ර අනවශ්‍ය ලෙස පොම්ප කරමින්, පසේ උශ්ණත්වය, ආම්ලිකතාවය සහ තැන් තැන් වල ගිලා බැසීම් හා නාය යාම් වලට පවා තුඩුදෙන, භූගත ජලය යොදාගෙන කරන පානීය ජල බොතල් කර්මාන්තය වහාම තහනම් කරනු ලැබේ. වාණිජ අරමුණු මුල්කරගෙන පිරිසිදු ජලය පිළිබඳව ජනතාව තුළ මේ වනවිට ඇතිකර ඇති හුඹස් බිය තුරන් කරන අතර එවැනි වැරදි පණිවිඩ සහිත වෙළඳ දැන්වීම් තනම් කොට, බෝතල් ජලය පිළිබඳ අති මිත්‍යා භක්තිය තුරන් කිරීමට කටයුතු කරමු.

12. එහිදී මෙම කර්මාන්තය වෙනුවෙන් දැනට ආයෝජනය කර ඇති ව්‍යවසායකයින් සහ එම කර්මාන්තය ආශ්‍රිතව ඍජු සහ වක්‍ර රැකියා මාර්ග අහිමි වන සියළු දෙනා වෙනුවෙන් විකල්ප වැඩපිළිවෙලක් සකස් කරමු.

13. දිවයිනේ ඇති කුඩා සහ විශාල ගලායන දිය පහරවල් පිළිබඳ ජී.පී.එස් (G.P.S) තාක්ෂණය යොදාගෙන සමීක්ෂණයක් වසර 2 ක් තුළ සිදු කර, එම සියළු ජල පහරවල් වල දෙපස ඇති මීටර් 200 ක් තුළ ඇති සියළු ඉඩම් රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කොට, ඒවායේ වගා කටයුතු, ඉදිකිරීම් වැනි මිනිස් ක්‍රියාකාරම් අවම කිරීමට කටයුතු කරමු. එම නීතිය ක්‍රියාත්මක කිරීමේදී දේශීය හා විදේශීය සංචාරක කර්මාන්තයට හානියක් නොවෙන පරිදි, මිනිසුන්ට ස්වභාවික පරිසරය වින්දීමට බාදා නොවෙන ලෙස, නමුත් විශේෂ නීති රෙගුලාසි යටතේ මෙම වැඩලිළිවෙල ක්‍රියාත්මක කරමු.

14. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා තිරසාර විකල්පයක් පිළිබඳව පර්යේෂණ කිරීමට ඉදිරිපත් වන සිසු සිසුවියන්ට, පුද්ගලයින්ට සහ ව්‍යවසායකයින්ට රජයෙන් මූල්‍යමය සහ අත්දැකීම ලබාගැනීම සඳහා අනුග්‍රහය දක්වනු ලැබේ.

15. නාගරික හා අර්ධ නාගරික කසල බැහැර කිරීම ක්‍රමවත් කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ ඉතා කඩිනම් වැඩපිළිවෙලක් දියත් කරන අතර, වෙන් කරන ලද කසළ පමණක්, වෙන වෙනම වර්ණ සහිත වාහන වල වෙනමම ස්ථාන වෙත ප්‍රවාහනය කර, ප්‍රතිචක්‍රීකරණ කටයුතු සඳහා යොමු කෙරේ. මෙම වර්ණයන් සම්මත වර්ණයන් වන අතර, කසළ බඳුනේ සිට, එක් එක් කසළ වර්ගය එකතු කරන්නට යොදාගන්නා සේවක සේවිකාවන් ගේ ඇඳුමේ වර්ණයේ සිට, වාහන සහ ප්‍රතිචක්‍රී බරන කර්මාන්තශාල දක්වා ක්‍රියාදාමයේ සියළුම දෙවල් වර්ණ ගැන්වීම තුළින් ජනතාවගේ, විශේෂයෙන් දරුවන්ගේ සිත් තුළ කසළ වර්ගීකරණය පිළිබඳව හැඟීම ජනිත කොට එය ජීවන පුරුද්දක් බවට පත් කිරීමට කටයුතු කරමු.

16. ජලය අපවිත්‍ර වන සියළු මිනිස් ක්‍රියාකරකම් වලට මනස වෙනස් කිරීම, තාක්ෂණය යොදා ගැනීම, භාවිතයන් වෙනස් කිරීම වැනි සියළු ක්‍රමවේද හරහා වසර 5 ක් තුළ නතර කරමු. එහිදී කර්මාන්ත ශාලා වල යම් වෙනසක් සිදු කිරීම සඳහා අවශ්‍ය ආයෝජන කිරීමට රජයෙන් සහනාධාර ලැබෙනු ඇත.

17. සියළුම සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශාලා සහ, විශාල කර්මාන්ත ශාලා ISO 14001, ISO 50001, COC වැනි පරිසයට අදාලව ඇති ජාත්‍යන්තර තත්ව සහතික ලබාගැනීම වසර 5 ක් තුළ අනිවාර්‍ය කෙරේ. එහිදී වැය වන මූලික පිරිවැය වෙනුවෙන් රජයෙන් සහන ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ.

18. සියළුම කර්මාන්ත ශාලා විසින් භාවිතා කරන ස්වභාවික සම්පත් (දැව, කර්මාන්ත්‍ය සඳහා ජලය, බලශක්තිය වැනි) නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳා කර්මාන්ත ශාලා හිමියන් සහ සමාගම් යම්කිසි විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු අතර, සියළු නව කර්මාන්ත වලට ආරම්භයේදීම එම නීතිය බලපානු ලැබේ. දැනට පවතින කර්මාන්ත ශාලා වසර 5 ක් තුළ එම සැළැස්ම රජයට ඉදිරිපත් නොකරන්නේ නම්, ඒ සඳහා දඩමුදල් අය කර රජය මඟින් එම වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා වැයව පිරිවැයෙන් 50% කට සමාන මුදලක් ආදායම් බදු වලින් නිදහස් කෙරෙනු ඇත.

19. දැව කර්මාන්ත ශාලා විසින් නව වන වගාවන් පවත්වාගත යුතු අතර, ඒ සඳහා දැනට රජයට අයිති නිසරු ඉඩම් ලබාදෙනු ලැබේ (රජයේ අයිතියට යටත්). එවැනි සහතික සහිත නිෂ්පාදන තෝරාගැනීම සඳහා ජනතාව දිරිගැන්වෙනු ඇත. තවද එවැනි සත්කාර්‍යයකට සම්බන්ධ වන කර්මාන්තශාලා අගය කිරීමේ වැඩ සටහන්, ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ආදිය රජයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

20. පුද්ගලික ඉඩම් වල ඇති විශාල ශාක රැකබලාගැනීම වෙනුවෙන් රජයෙන් ආධාර මුදලක් ආර්ථික මට්ටම් සැළකිල්ලට නොගම්නිම් සියළු දෙනාට වාර්ෂිකව ලබාදෙනු ලැබේ. ඒ අනුව සිය ගෙවත්තේ එක් කොස් ගසක් අඹ ගසක් පමණක් නොව පල නොදරන ගසක් පවා තිබේ නම් (අවශ්‍ය වට ප්‍රමාණය තිබිය යුතුය) ඉහත කී දීමනාව ලැබේ. එහිදී, එම මුදල පවුලේ දරුවන් ඇත්නම් ඔවුන්ගේ බැංකු ගිණුම් වලට සෘජුවම බැර කරනු ලැබේ.

21. මෙම ශාකයන්ගේ දත්තයන් වෙනමම ගබඩා කර ශාකයන් සඳහා ජාතික අංකයක් ලබාදෙනු ඇත. තෝරාගත් ශාඛ වල ගබඩා වී ඇති කාබන් ප්‍රමාණය ගණනය කිරීම සඳහා සැටලයිට් තාක්ෂණය යොදා ගැනේ.

21. දැනට ගස් කැපීම පිළිබඳව ඇති සියළු ප්‍රතිපත්ති නැවත විමසා බලා, කිසිදු ගසක් තම හිතු මතයට කැපීමට නොහැකි ලෙස නීති පණවමු. මෙහිදී ජනතා අවශ්‍යතාවයන් සපුරාගැනීමට කිසිදු බාධාවක් නොවෙන අයුරින් මෙම නීතිය ක්‍රියාත්මක කරමු. ගෙවත්තේ තිබෙන ශාක වලට රජයෙන් ආදායමක් ලැබෙන්නේ නම්, ජනතාව නිකරුණේ ගස් කැපීම පිළිබඳ දෙවරක් සිතනු ඇතයි අපි අපේක්ෂා කරමු.

22. ප්‍රාථමික පන්ති වල, 5 ශිෂත්ව විභාගය අහෙසි කිරීම වැනි ප්‍රතිසංස්කරණ වල්දී, පරිසර විෂය පරිසරාඅනුබද්ධ ලෙස සකස් කොට වඩා විනෝදාත්මක හා ප්‍රායෝගික අත්දැකීමක් ලෙස සහ පරිසර දැනුම මැනීම පැවරුම් ආකාරයට සිදු කරන්නට කටයුතු කරමු.

23. විකල්ප බලශක්ති ක්‍රම, විශේෂයෙන් සූර්‍ය බලශක්තිය, සුළං බලය, ජීව වායු සැපයුම් ආදිය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට, ජල විදුලිය හා ගල් අඟුරු භාවිතයෙන් බලශක්තිය නිපදවීමේ පැරණි ක්‍රම ක්‍රමක්‍රමයෙන් ඈත් කරමු.

24. අති සංවේදී පරිසර කළාප හඳුනාගෙන ඒවා සංරක්ශණය කිරීමේ වැඩපිළිවෙලක් තරුණ තරුණියන් ගේ සහභාගීත්වයෙන් තිරසාර ලෙස ක්‍රියාත්මක කරමු. දැනට ශ්‍රී ලංකා රජය යම්කිසි රටක් හෝ ආයතනයක් සමඟ ඉඩම් සම්බන්ධව ගිවිසුම් වලට එළඹී ඇත්නම්, ඒ ගිවිසුම් සියල්ලම නැවත විමසා බලා, යම් පරිසර හානියක් වෙ අයැයි අවදානමක් ඇති සියළු ව්‍යාපෘති අත්හිටවනු ලැබේ.

25. ජෛව විවිධත්වය හා වඳවීගෙන යන සතුන් ආරක්ෂා කිරීම සඳහා විද්වතුන්ගේ මැදිහත් වීම වඩා කාර්‍යක්ෂම ලෙස යොදා ගනිමු, දැනට ඇති වැඩපිල්ළිවෙලවල් තවදුරටත් ශක්තිමත් කරමු.

26. සිංහරාජය, දෙල්ලව, බඹරකොටුව, කොට්ටව, බඩගමුව, රිටිගල, මින්නේරිය, උඩවලව වැනි රක්ෂිත වල මායිම් වල වෙසෙන ගැමියන් ගේ ක්‍රියාකාරකම් යම් පාලයනයකට නතු කළ යුතු අතර රක්ෂිත වල සිදුවන අනවසර ගස් කැපීම්, සතුන් දඩයම් කිරීම් ආදිය නතර කිරීම සඳහා තොරතුරු තාක්ෂණයද උපයෝගී කරගනිමින්, ගැම් වැසියන්ගෙ ජීවනෝපාය සංවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ වගේම, ඔවුන් වනය එළිපෙහෙළි කර හේන් වගා කිරීම වැනි කටයුතු වහාම නතර කර ඔවුන් ව දැනුවත් කිරීම සන විකල්ප සැපයීම සිදු කෙරේ.

27. රට පුරා විසිරී පවතින වන අලින්ගේ ගමන් මාර්ග පිළිබඳ විධිමත් අධ්‍යනයක් සිදු කොට සිතියම් ගත කර, හැකිතරම දුරට එම ගමන් මාර්ග ප්‍රතිස්ථාපනය කොට, වන අලින් ගම් වැදීම අවම කිරිම්ම සඳහා පිළියම් සකස් කරනු ලැබේ. විශේෂයෙන්, මහා මාර්ග සහ දුම් රිය මාර්ග එවැනි අලි මන්කඩවල් හරහා වැටී ඇති ස්ථාන වල අවම වශයෙන් මීටර 500 ක් දුරට පාළම් ඉදි කර වන අලින් රිය අනතුරු වලින් මිය යෑම නතර කිරීමට කටයුතු කරමු.

28. දිවයින වටා ඇති සංචාරක හෝටල් සහ කර්මාන්ත ශාලා, කාර්‍යාල වැනි ස්ථාන සියල්ලෙහි අපද්‍රව්‍ය බැහැර කිරීම අධීක්ෂණය කර සාගරවල හා නොගැඹුරු සාගර දූෂණය අවම කරමු.
29. සුනාමි ව්‍යසනය නිසා සහ, වාණිජ අරමුණු සඳා හිරිගල් කැඩීම, අධික ලෙස මෝටර් බෝට්ටු භාවිතය නිසා මැරී ඇති කොරල් පර ප්‍රතිස්ථාපනය කිරීමට විශේෂඥ සහාය ඇතිව සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ. අවදානමට ලක්වී ඇති සාගර කළාප වල මිනිස් ක්‍රියාකාරකම් නත කිරීමේ වැඩපිළිවලක් දියත් කරනු ලැබේ.

30. මත්ස්‍ය කර්මාන්තයේ දැනට සිදුවෙතැයි වාර්තා වන වැරදි ආම්පන්න භාවිතය සහ වැරදි ක්‍රමවේද භාවිතය නතර කර තිරසාර මත්‍ය කර්මාන්තයක් සඳහා වැඩපිළිවෙලක් සකස් කරනු ලැබේ.

31. වෙරළ තීරයේ සුනාමිය නිසා සිදුවූ වෙරළාසන්න ශාකයන් ඇතුළු පරිසර පද්ධතිය ක්‍රමවත් ලෙස ප්‍රතිස්ථාපනය කෙරේ.

32. මනජනතාවගේ පුද්ගලික ආර්ථිකය සඳහා රජයෙන් විශාල උපදීශණ මාලාවක් ඇරඹීමට අදහස් කරන අතර ඒ හරහා නාගරික ප්‍රදේශවල සහ කර්මාන්ත පුරයන් පිහිටි ප්‍රදේශවල ජීවත් වන අයගී සහ අනෙකුත් ප්‍රජාව අතර පවතින 'සෂේ' සංස්කෘතිය තරමක් දුරට හෝ ඈත් කොට, පරිසරය සිදුවන හානි අවම කිරීමට පියවර ගැනේ.

33. සියළුම සුපිරි වෙළඳ සැල් වල සහ අනෙකුත් තොග සහ සිල්ලර වෙළඳ සැල් වල 'පොලිප්‍රොපිලීන්' සහ 'ප්ලස්ටික්' අමුද්‍රව්‍ය යොදා නිපදවන මළු තහනම් වන අතර, එම කර්මාන්තයේ නියලෙන අයට ස්වභාවිකව දිරාපත් වන ඕනෑම අමුද්‍රව්‍යයකින් මළු නිෂ්පාදනය කිරීමට, පයේෂණ කිරීමට රජයෙන් සහයෝගය ලැබේ. සිය නිෂ්පාදනය මාරු කරන කාල සීමාව තුළ කර්මාන්ත කරුවන්ට සිදුවන ආර්ථික පාඩුව නිවැරදි ලෙස තක්සේරු කර එම මුදල (යම්කිසි නිස්චිත කාලසීමාවකට යටත් ව)රජයෙන් ගෙවනු ලැබේ. එවැනි විකල්ප පිළිබඳ පයේෂණ කරන සිසුන්ට සහ ව්‍යවසායකටින්ට ද රජයේ මූල්‍ය සහ වෙනත් අනුග්‍රහ ලැබේ. සුපුරුදු 'සිලි සිලි' මළු භාවිතයෙන් ඈත් වීමට ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට පියවර ගනු ලැබේ.

34. වන විනාශය හෙවත් වනහරණය (deforestation) යන වචනයෙහි වර්තමාන නිර්වචනය පරිසර නීතියම අවශ්‍යතාවයන් සඳහා තවදුරටත් පුළුක් කොට, මහා පරිමාණ ජලාශ වලට යටවන ප්‍රදේශය ද (deforestation) යන වචනයෙහි අර්ථනිරූපණයට ඇතුළත් කරනු ලැබේ. එවිට ජලාශ ඉදි කිරීමට අපගේ රජයෙන් හෝ අනාගතයේදී වෙනත් රජයකින් සැලසුම් සකස් කාළහොත්, ඒවායේ පරිසර වාර්තා සකස් කරීමේදී වඩාත් පුළුල් දිෂ්ඨී කෝණයකින් ශක්‍යතා වාර්තා සකස් කිරීමට හැකි වනු ඇත.

35. පරිසරයට දීර්ඝකාලීන ලෙස සහ අහිතකර ලෙස බලපෑම් එල්ල කරන, මෑත ඉතිහාසයේ අනුගමනය කරන ලද යුධ උපක්‍රම කෙරෙහි අවධානය යොමුකොට, යුධ උපක්‍රම විශේෂඥයින් ගේ සහභාගීත්වයෙන් විකල්ප උපාය මාර්ග හඳුවා දෙන අතර, එවැනි අවශ්‍යතාවයන් සඳහා කෙරෙන වන සංහාරය මුළුමනින් ම නතර

කරනු ලැබේ. වනයක් එළිපෙහෙළි කර හමුදා කඳවුරක් ඉදි කිරීම කරනු ලබන්නේ වෙනත් විකල්ප නැති අත්‍යාවශ්‍ය අවස්ථාවකදී පමණි. තවද සතුරා විසින් මහා මාර්ග දෙපස සැඟවී සිට පහර දෙන (Ambush) අවස්ථා අවම කිරීමට දැනට භාවිතා වන සරළ ක්‍රමය වන මාර්ගහ දෙපස අඩි 100 ක පමණ කැළෑ රොද එළි කිරීම වෙනුවට තාක්ෂණය යොදාගෙන එවැනි පහරදීම් කළින් හඳුනාගැනීමට ඇති ඉඩකඩ සොයා බලනු ලැබේ.

ලොව කිසිදු ප්‍රතිපත්තියක් නැවත සංශෝධයන කළ නොහකි සේ හෝ සංවර්ධනය කිරීමට අවශ්‍ය නොවන සේනිර්මාණය කළ හොනැක. නමුත්, පුරවැසියන් හා බදු ගෙවන්නන් ලෙස ඔබ අප සියළු දෙනා මුහුණ දෙන අවහිරතාවයන් හා අපහසුතාවයන් පිළිබඳ අපට ඉතා හොඳ අවබෝධයක්ඇත. එම නිසා, මේ පිළිබඳව වඩා දැනුවත් අයෙක් වෙතොත් ඔවුන්ගේ අදහස් හා යෝජනා අපවෙත ඉදිරිපත් කරන්නේ නම් රට ගොඩ නැගීමේ මහන්භූ කර්තව්‍යයට ඔබගේ දායකත්ව දැක්වීමේ ගෞරවය ඔබට හිමිවනු ඇත.

උදාර ශ්‍රී ලංකා •உதார ஸ்ரீ லங்கா • UDARA SRI LANKA

Team #bettersrilanka
Released & published on 19th Sep 2018

All rights reserved by www.bettersrilanka.org
Email- team@bettersrilanka.org
Facebook: https://www.facebook.com/bettersrilanka2020/